නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) එතුමාගේ මේ සපත්තු දෙක මතුපිටින් පිරිමදිනු මම දැක ඇත්තෙමි.

අබ්දු කයිර් තුමා අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් ලබා මෙසේ වාර්තා කරන ලදී. ‘දහම චින්තනයෙන් යුත් වී නම්, මේස් සපත්තුව පහළ කොටස එහි ඉහළ කොටසට වඩා පිරි මැදීමට යෝග්ය වනු ඇත. නමුත් “නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි
වසල්ලම්) එතුමාගේ මේ සපත්තු දෙක මතුපිටින් පිරිමදිනු මම දැක ඇත්තෙමි.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරයි. ‘දහම කියූ පරිදි නොව බුද්ධිමය ලෙසින් ගනු ලබන්නක් වී නම්, මේස් සපත්තුව පහළ කොටස එහි ඉහළ කොටසට වඩා පිරි මැදීමට සුදුසු වනු ඇත. හේතුව සැබැවින්ම එහි පහළ කොටස ඍජුව මහපොළොවේ මෙන්ම එහි ඇති කිලිටි හා අපවිත්ර දෑහි ගැටෙන බැවිණි. ඒ අනුව බුද්ධිමය කෝණයෙන් බැලූ විට පිරිමැදීමට වඩාත් සුදුසු වන්නේ එයයි. නමුත් ෂරීආ පිළිවෙත එයට විරුද්ධව පැමිණ ඇත. ඒ අනුව කටයුතු කිරීමත් මූලාශ්රයට විරුද්ධ අදහස් අත්හැරීමත් අනිවාර්යය වන්නේය. නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) එතුමාගේ මේස් සපත්තු දෙක මතුපිටින් පිරිමදිනු ඔහු දැක ඇත. තවත් පැත්තකින් බලන කළ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා සිදු කළ දෑ බුද්ධියට අනුකූලව ද පිහිටයි. ඊට හේතුව මේස් සපත්තුවට පහළ කොටස ජලයෙන් පිරිමදින විට, අපවිත්ර දෑ එය ඉසිලීමට හේතු වන්නේය. එබැවින් ඊට ඉහළින් තැවරුණු දුහුවිලි ඉවත් කිරීම සඳහා එහි ඉහළ කොටස පිරිමැදීම නියම වන්නේය. ඊට හේතුව සැබැවින්ම දකින කොටස මේස් සපත්තුවේ මතුපිට කොටස වන බැවිණි. ඒ අනුව එය පිරිමැදීම වඩාත් යෝග්ය වේ. ආගමික නීති සියල්ලක්ම සහජ බුද්ධියට පටහැනිව පිහිටා නැත. නමුත් ඇතැම් අවස්ථාවලදී ඇතැම් බුද්ධිමතුන්ට එය සැඟවී පවතී.

http://sunnah.global/hadeeth/si/show/8390